## සංක්ෂිප්තය.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ පාසල ප්‍රමුඛ ආයතනයකි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයාට ප්‍රධාන චරිතයක් හිමිවේ.සෑම වෘත්තියකටම අඛණ්ඩ පුහුණුව හා කුසලතා අවශ්‍ය වන අතර ගුරු වෘත්තියට ද අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය අත්‍යවශ්‍ය වේ. ගුරු වෘත්තීය සංවර්ධනය මූලික පූර්වසේවා පුහුණුවෙන් පමණක් අවසන් නොවේ. අධ්‍යාපන අමාත්‍යාංශය පෙන්වා දෙන පරිදි අධ්‍යාපන පද්ධතියේ වෘත්තීය සංවර්ධනය යන්න අත්‍යවශ්‍ය සාධකයකි. වර්තමානය වනවිට ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ,ජාතික අධ්‍යාපන ආයතනය, ගුරු විද්‍යාල මෙන්ම ගුරු මධ්‍යස්ථාන ද ගුරු වෘත්තීය සංවර්ධනය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. ශ්‍රී ලංකාවේ ගුරු මධ්‍යස්ථාන මඟින් ගුරුවරුන් සඳහා එක් එක් ශ්‍රේණි වලදී සම්පූර්ණ කළයුතු මොඩියුල සඳහා පවත්වනු ලබන වැඩසටහන්වල ගැටලු පවතින බව ගුරු මධ්‍යස්ථාන සම්බන්ධව කරන ලද .පෙර අධ්‍යයන මගින් කරුණු අනාවරණය කර ඇත. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ ගුරු වෘත්තීය සංවර්ධනය සඳහා ගුරු මධ්‍යස්ථාන මගින් සිදුකරනු ලබන දායකත්වය විමසා බැලීමයි. මෙම ප්‍රධාන අරමුණ යටතේ සුවිශේෂී අරමුණු ඉටුකර ගැනීම සඳහා සමීක්ෂණයක් සිදුකරන ලදී. එම සුවිශේෂී අරමුණු නම් ගුරු වෘත්තීය සංවර්ධනය සඳහා ගුරු මධ්‍යස්ථාන මඟින් සිදුවන වැඩසටහන් හඳුනා ගැනීම , ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනයට එම වැඩසටහන් මඟින් සිදුවන බලපෑම සොයා බැලීම , ගුරු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ගුරු මධ්‍යස්ථාන මුහුණ දෙන ගැටලු විමසා බැලීම සහ ගුරු වෘත්තිය සංවර්ධනය උදෙසා ගුරු මධ්‍යස්ථානවල දායකත්වය ඉහළ නැංවීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමයි. පර්යේෂණයේ නියදිය වශයෙන් කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් ගුරු මධ්‍යස්ථාන තුනක සේවය කරන ගුරු මධ්‍යස්ථාන කළමණාකරුවන් තිදෙනෙකු සහ 2019 වසරේ එම ගුරු මධ්‍යස්ථානවල වැඩසටහන් සඳහා සහභාගී වූ ගුරුවරුන් 230 දෙනාද යොදාගනු ලැබීය.මෙම පර්යේෂණයේ දත්ත රැස්කිරීම ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මෙන්ම ලිඛිත මූලාශ්‍ර මගින් සිදුකළ අතර විස්තරාත්මක ක්‍රමය යටතේ දත්ත වගු සහ රූප සටහන් මගින් ඉදිරිපත්කර ඇත. මෙම අධ්‍යයනයේ දී ගුරුවරුන් හා ගුරු මධ්‍යස්ථාන කළමණාකරුවන් ලබාදුන් ධනාත්මක සහ ඍණාත්මක අදහස් විශ්ලේෂණයෙන් පසු ගුරු වෘත්තීය සංවර්ධනය සඳහා ගුරු මධ්‍යස්ථාන මගින් සිදුකරනු ලබන වැඩසටහන්වල ස්වභාවයත් එළඹී නිගමන හා යෝජනාත් ඉදිරිපත් කර ඇත. එහි දී ගුරු වෘත්තීය සංවර්ධනය සඳහා පිහිටුවා ඇති ගුරු මධ්‍යස්ථාන මඟින් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා වැඩිවශයෙන් මොඩියුල ක්‍රියාත්මක කරන අතර අනෙකුත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අවම මට්ටමක පවතින බව නිගමනයකළ අතර ගුරු මධ්‍යස්ථානවලින් ගුරු වෘත්තීය සංවර්ධනය හා ඒවායේ නිසි ක්‍රියාකාරීත්වයට වසර පුරා ක්‍රියාත්මක වන වැඩපිළිවෙලක් අධ්‍යාපන අමාත්‍යාංශය නිර්මාණය කළ යුතු බව යෝජනා කර ඇත.

## Abstract

The school is a leading institution in the education system of Sri Lanka. The teacher plays a key role in the teaching and learning process. Every profession requires continuous training and skills. Continuing professional development is essential for the teaching profession as well. Career development is an essential factor in the present system of universities in Sri Lanka. National Institute of Education, teacher training colleges as well as teacher centers Implement various programs for the development of the teaching profession. The main objective of this study was to examine the contribution made by teacher centers to the development of the teaching profession. These specific objectives are to identify the programs conducted by the teacher centers for the development of the teaching profession, to look into the impact of the programs on the professional development of the teachers and to look into the problems faced by the teacher centers in the implementation of the teacher development program and Proposals to increase the contribution of teacher training centers for the development of the teaching profession. The research samples were used from three teacher center managers working in three teacher centers in the Kegalle district and from the teachers who participated in the programs of those teacher centers in 2019 out of the two hundred and thirty. The data collection of this research was done through questionnaires and interviews as well as written sources and presented in the form of data tables and diagrams under the detailed methodology. The nature of the programs carried out by the teacher centers for development and hence the conclusions and suggestions have been made where the teacher centers established for the development of the teaching profession activate most of the modules for the professional development of the teachers and the implementation of other programs is at the lowest level throughout the year. It has been suggested that the Ministry of Education should create a non-functional curriculum.